# රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ නිපුණතා පරික්ෂණය සඳහා නිවේදනය

රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා **EPS – TOPIK** සමත් වූවන් වෙනුවෙන් ප්‍රථම වරට නිපුණතා පරික්ෂණයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම පරික්ෂණය සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් පහත සඳහන් පරිදි අයදුම් කල යුතුය.

2011 ඔක්තෝබර් 28

අධීක්ෂණය කරනු ලබන්නේ - කොරියානු ජනරජයේ(MOEL) රැකියා හා කම්කරු අමාත්‍යාංශය
පරිපාලනය කරනු ලබන්නේ - කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය
සහයෝගීතාවය දක්වන්නේ - විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

1. පරික්ෂණය වෙත අයදුම් කිරීම සඳහා අදාල වන ක්ෂේත්‍රයඃ නිෂ්පාදන ක්ෂේත්‍රය

2. සුදුසුකම්
   **A. 8** වැනි **EPS – TOPIK** තුලින් ලබා ගත් ලකුණු ප්‍රමාණය 172 නම් (මුළු ලකුණු ප්‍රමාණයඃ 200 ) (ප්‍රතිඵල 2010 නොවැම්බර් 18 වන දින නිකුත්කරන ලදී)
   **B. 9** වැනි **EPS – TOPIK** තුලින් ලබා ගත් ලකුණු ප්‍රමාණය 172 නම් (මුළු ලකුණු ප්‍රමාණයඃ 200 ) (ප්‍රතිඵල 2011 ඔක්තෝබර් 28 වන දින නිකුත්කරන ලදී)
   ※ කොරියාවට ඇතුළු වී සිටින අය, රැකියා අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබූ අය (ආගමන හා විගමන) හා කොරියානු රජයෙන් වීසා (CCVI) ලබාගැනීමට අනුමැතිය නැති අය ලියාපදිංචිය සඳහා වලංගු නොවේ.

3. ලියාපදිංචිය
   A. ලියාපදිංචි කාලය : 2011 නොවැම්බර් 1 සිට 3 දක්වා (දින 3ක්)
   ※ ලියාපදිංචිය සිදුකරන වේලාව : 9.00 - 18.00 (දිවා ආහාරය 12.00 - 13.00)
   B. ලියාපදිංචිය සිදුකරන ස්ථානය : ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාලය
   C. ලියාපදිංචිය සිදුකරන ආකාරය : පෞද්ගලිකවම පැමිණීමෙන් හෝ දුරකථන මාර්ගයෙන්
   D. ලියාපදිංචිය සිදුකිරීමට අදාල ලියකියවිලි : අනන්‍යතා පත්‍රය (විදේශ ගමන් බලපත්‍රය) හෝ EPS – TOPIK ප්‍රවේශ පත්‍රය (Admission Ticket)
   E. පරීක්ෂණයට අදාල ගාස්තුව : ගාස්තු රහිත වේ

4. පරීක්ෂණය සිදුකරන දිනය/වේලාව, එක් එක් අයදුම්කරුට අදාල ස්ථානය වැනි තොරතුරු නිවේදනය කිරීම
   A. නිවේදනය කරන දිනය : 2011 නොවැම්බර් 23
   B. නිවේදනය කරන ආකාරයඃ
      - විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දැන්වීම් පුවරුව
      - විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය (http://www.slbfe.lk)
   C. පරීක්ෂණය පැවැත්වීමට අපේක්ෂිත දිනය : 2011 දෙසැම්බර් 3 සිට 9 දක්වා (දිනය වෙනස්වීමට ඉඩ ඇත)

5. පරීක්ෂණයේ ප්‍රතිඵල නිවේදනය කිරීම
   **A.** දිනය : 2011 දෙසැම්බර් 20 (අඟහරුවාදා)
   **B.** ආකාරය :
      - EPS වෙබ් අඩවියට පිවිසෙන්න (http://www.eps.go.kr)
      - බහු භාෂා කොටසට සම්බන්ධ වන්න
      - අදාල කොටසට ඇතුළු වන්න (Sign up)
      - පරීක්ෂණයේ ප්‍රතිඵල පෞද්ගලිකවම පරීක්ෂා කරන්න

6. වැඩිම ලකුණු ලබාගත් අය හා සහභාගිවන්නන් සඳහා ලැබෙන විශේෂ ප්‍රතිලාභ

A. ඉහල ලකුණු ලබාගත් අය කොරියානු සේවා යෝජකයන් වෙත කොරියානු රැකියාවක් සඳහා රෙකමදාරු කිරීමේදී ඔවුන් හට ප්‍රමුඛත්වය ලබාදීම (වාර 3 ක්)

B. නිපුණතා පරීක්ෂණයට සහභාගිවූවන් හට කොරියානු රැකියා ස්ථානයක් රෙකමදාරු කිරීමේදී, දෙවන වරට ප්‍රමුඛත්වය ලබාදීම (වාර 3 ක්)

C. ඉහල ලකුණු මට්ටම් ලබාගැනීම සඳහා : සෑම කොටසකටම ලකුණු 40කට වඩා ලැබෙන පරිදි මුළු ලකුණු 240කට වැඩියෙන් ලබාගත යුතුය.

7.නිපුණතා පරීක්ෂණය සිදුකරන ආකාරය හා ඊට අදාල විස්තර

A. නිපුණතා පරීක්ෂණයේ අඩංගු කොටස් හා ඒ සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය

- ශාරීරික පරීක්ෂණය, රැකියා අත්දැකීම් හා සම්මුඛ පරීක්ෂණයේ ඇගයීම, මූලික නිපුණතා පරීක්ෂණය යන කොටස් 3න් නිපුණතා පරීක්ෂණය සමන්විත වේ.

B. ලකුණු බෙදා ඇති ආකාරය

| මුළු ලකුණු | ශාරීරික පරීක්ෂණය | සම්මුඛ පරීක්ෂණයේ ඇගයීම | මූලික නිපුණතා පරීක්ෂණය | විශේෂ කරුණු |
|---|---|---|---|---|
| 300 | 100 | 100 | 100 | |

8. ශාරීරික පරීක්ෂණය සඳහා අදාල කරුණු

| පරීක්ෂණයට භාජනය වන කරුණු | විස්තර | විශේෂ කරුණු |
|---|---|---|
| මූලික ඉරියව්ව | දෙඅත් දිගහැර පස් වාරයක් උඩපැනීම | |
| දරාගැනීම | නොකඩවා කරන පුෂ්-අප්ස්/ඩිප්ස් (push – ups/dips) මැන බැලීම (මිනිත්තු 1ක්) | |
| අල්ලාගැනීමේ ශක්තිය | මැණුම් උපකරණයක් මගින් එක් අතකින් අල්ලා ගැනීමේ ශක්තිය මැනීම (කිලෝග්‍රෑම් වලින්) | |
| නම්‍යශීලීත්වය | මැනුම් උපකරණයක් මත හිඳ ශරීරයේ ඉහල කොටස නැවීමේ හැකියාව මැනීම (සෙන්ටිමීටර් වලින්) | |
| පිටුපස මාංශපේශීවල ශක්තිය | මැණුම් උපකරණයක් මගින් පිටුපස මාංශපේශීන්ගේ ශක්තිය වරක් පමණක් මැනීම (කිලෝග්‍රෑම් වලින්) | |

9. සම්මුඛ පරීක්ෂණය ඇගයීම සඳහා අදාල කරුණු

| ඇගයීමට භාජනය වන කරුණු | ඇගයීමේ විස්තර | විශේෂ කරුණු |
|---|---|---|
| මූලික සන්නිවේදනය | කොරියානු භාෂාවෙන් මූලික සන්නිවේදනය | සම්මුඛ පරීක්ෂණය පටිගත කරනු ලබන අතර (තත්පර 30ක් පමණ) එය කොරියානු සේවා යෝජකයාට ලබාදෙනු ඇත. |
| වාක්‍ය කියවීම | කොරියානු භාෂාවෙන් වාක්‍ය 4ක් හෝ 5ක් කියවීම | |
| අණදීම් තේරුම් ගැනීම | කොරියානු භාෂාවෙන් කරන මූලික අණදීම් තේරුම්ගැනීම | |
| රැකියා අත්දැකීම් | රැකියා අත්දැකීම් හා රැකියාවේ නිරත වී සිටි කාලය | |
| පෞරුෂත්වය හා හැකියාව | ආකල්ප, ධනාත්මක බව, සූදානම් බව, වැනි | |

## 10. මූලික නිපුණතා පරීක්ෂණය සඳහා අදාල කරුණු

| ඇගයීමට භාජනය වන කරුණු | ඇගයීමේ විස්තර | විශේෂ කරුණු |
|---|---|---|
| අදාල උපකරණයේ නම සඳහන් කරන්න | උපකරණයේ නම පිළිබඳව කතාකිරීම (ප්‍රශ්න 3ක්), ඇහුම්කන් දීම හා සෙවීම (ප්‍රශ්න 3ක්) | |
| කුරු අදාල ස්ථානයේ තැබීම | එකිනෙකට වෙනස් කුරු, පුවරුව මතතැබීම ( විවිධ වර්ණ, හැඩ, ප්‍රමාණය) | |
| එල්ලා වැටෙන ද්‍රව්‍ය භාවිතා කිරීම | විවිධ ප්‍රමාණයේ එල්ලා වැටෙන ආකාරයට ඇති වළළු නිසි ආකාරයට තැබීම | |
| පටවන ද්‍රව්‍ය (Loading Material) | වැඩකරන මොඩලයට (Work Model) අදාල වන ද්‍රව්‍ය කැබලි එක්කොට පුවරුව මත නිසි ආකාරයට තැබීම | |

## 11. අයදුම්කරුවන්ට උපදෙස්

A එක් එක් අයදුම්කරුට අදාල වන පරීක්ෂණ දිනය හා ස්ථානය 2011 නොවැම්බර් 23 වන දින (බදාදා) නිවේදනය කරනු ලබන අතර කරුණාකර එදින එම නිවේදනය වෙත ඔබේ අවධානය යොමු කරන්න.

B ඔබට නියම කරනු ලැබූ පරීක්ෂණ දිනය හා වේලාව වෙනස් කිරීමට නොහැකි වන අතර කෙනෙකු හට නියමිත කාලයට පසු පරීක්ෂණ ස්ථානයට ඇතුළු වීමට අවසර නොලැබෙනු ඇත.

C අනන්‍යතා පත්‍රය (විදේශ ගමන් බලපත්‍රය) හා ප්‍රවේශ පත්‍රය (Admission Ticket) රහිතව පැමිණෙන්නන් හට ඇතුළු වීමට අවසර නොලැබෙනු ඇත.

D පරීක්ෂණයට අදාල වන උපකරණ පරීක්ෂණ ස්ථානයේදී සපයනු ලැබේ. එබැවින් අයදුම්කරුවන් විසින් කිසිදු උපකරණයක් ගෙන ඒම අනවශ්‍යය.

E පරීක්ෂණය අතරතුරේදී ඔබගේ ආරක්ෂාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමු කරන මෙන් අපි ඔබට දන්වා සිටිමු. ඔබගේ නොසැලකිල්ල නිසා සිදුවන අනතුරු සඳහා ඔබ විසින් සම්පූර්ණයෙන්ම වගකිවයුතු වේ.

F පරීක්ෂණය කිරීමට පහසු වන පරිදි හා පරීක්ෂණයට බාධා නොවන පරිදි සුවපහසු හා පිරිසිදු ඇඳුමකින් ඔබ සැරසී පැමිණිය යුතුය.

G පරීක්ෂණය අතරතුර වංචා සහගත ලෙස හැසිරුනහොත් ඔබ ලබා ගත් ලකුණු ප්‍රමාණය 'O' ලෙස සලකනු ඇත.

H කරුණාකර මේ සමග නිවේදනය කෙරෙන පරීක්ෂණය සම්බන්ධ උපදෙස් (Task Instructions) කියවා බලා පරීක්ෂණයෙන් උසස් ප්‍රතිඵල ලබා ගැනීමට සූදානම් වන්න.

I නිපුණතා පරීක්ෂණයේ ප්‍රතිඵල කුමක් වුවත්, සෑම EPS - TOPIK සමත් වූවෙකුටම කොරියානු රැකියාවක් සඳහා අයදුම් කිරීමේ හැකියාව ඇත. කෙසේ වෙතත් පරීක්ෂණය අතරතුර පටිගත කර ලද වීඩියෝව කොරියානු සේවා යෝජකයාට යොමු කරනු ඇත.